# පැල්මඩුල්ල අරමණපොල රජමහා විහාරයේ ඓතිහාසික වැදගත්කම

එම්.එම්. මනීෂා හර්ෂණී[1], ඩී.ජ්. සරෝජනී මානෙල් මැණිකේ[2]

රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ග්‍රාමයේ පිහිටා තිබෙන ගණේගම රජමහා විහාරය අරමණපොල විහාරය, දෙනවක විහාරය යන නම්වලින් ද හඳුන්වනු ලැබේ. අරමණ දේශයෙන් හෙවත් වර්තමාන බුරුම රටින් වැඩම කරන ලද භික්ෂූන් වහන්සේලා ශ්‍රී පාදය වන්දනා කිරීම සඳහා පැමිණ නවාතැන් ගෙන ඇත්තේ මෙම ගණේගම අරමණපොල රජමහා විහාරයේය. මෙම විහාරය සම්බන්ධව පවතින මූලාශ්‍රය සාධක අනුව එය අනුරාධපුර යුගය දක්වා දිව යයි. නමුත් සිරි ගුණසිංහ විසින් මෙම විහාරයේ සියලු වාස්තු ලක්ෂණ කෝට්ටේ යුගයට අයත් වන බව දක්වා තිබේ. මූලාශ්‍රය සාධක සහ දැනට ශේෂව පවතින වාස්තු ලක්ෂණ සලකා බලන විට විහාරයේ ඓතිහාසික දින නීර්ණයන් වඩාත් පූර්ව කාලයක් දක්වා ගෙන යාහැකි බව විමර්ශනය කිරීම පර්යේෂණයේ අරමුණ වේ. පූර්වෝක්ත අරමුණ ඉටුකර ගැනීම සඳහා මූලික වශයෙන් පොත්පත් පරිශීලනය සිදුකළ අතර ඊට අමතරව සම්මුඛ සාකච්ඡා මගින් කරුණු එක්රැස් කරගන්නා ලදී. අනුරාධපුර යුගයේ පශ්චිම සමයේ කෲර චෝල ආක්‍රමණිකයන් විසින් ලක්දිව ශ්‍රී විභූතිය විනාශ කල අවධියේ භික්ෂූන් වහන්සේ නමකට ජීවත් විය නොහැකි වාතාවරණයක් ඇති වූ බව චූලවංශයේ දැක්වේ. මෙම විනාශයෙන් ලක්දිව මුදාගනු ලැබුවේ විජයබා රජතුමා විසිනි. එතුමා රාජ්‍යයට පත්වී නැවත බුද්ධ ශාසනය නගා සිටුවීම සඳහා අරමණ දේශයෙන් භික්ෂූන්වහන්සේලා විසිනමක් වැඩම කළ බව මහාවංසයේ සඳහන් වේ. මහනුවර සමයේ ලියැවී ඇති විහාර අස්නෙහි දෙනවක නාමයෙන් හඳුන්වන්නේ මෙම ගණේගම විහාරයයි. පෘතුගීසි සමයේ උඩරට ආක්‍රමණය සඳහා ගිය පෘතුගීසි සෙන්පති අසවේදු දෙනවක ආශ්‍රිතව දෙනවක බලකොටුව ගොඩනගාගත් බව ඓතිහාසිකව පිළිගැනේ. ගණින්නාන්සේලා නම් භික්ෂු කොටසක් ජීවත් වී ඇති නිසා ගණේගම ලෙස මෙම විහාරයට හඳුන්වන බව විශ්වාස කෙරේ. ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් හටගත් දෙතිස් ඵල රුහ බෝධීන් වහන්සේලාගෙන් එක් ශාඛාවක් මෙම ගණේගම රජමහා විහාරයේ ද රෝපණය කර ඇති බව සිංහල බෝධිවංසයේ සඳහන් වේ. පොළොන්නරු යුගය වනවිට මෙම ස්ථානය දෝණාවක්ක ලෙස හඳුන්වා ඇත. කෙසේ වෙතත් මෙම විහාරය ආශ්‍රිතව නිර්මාණය කර ඇති කැටයම්, චිත්‍ර ආදිය මගිනුත් විහාරය හා සම්බන්ධ ඓතිහාසික මූලාශ්‍රය මගිනුත් පෙනී යන්නේ කෝට්ටේ යුගයට වඩා පැරණි සාධක සහිත ඉතිහාසයකට මෙම විහාරය අයත් වන බවයි.

**ප්‍රමුඛ පද :** බෝධීන් වහන්සේ, විහාරය, භික්ෂූන් වහන්සේලා, ඓතිහාසික, යුගය

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.mmhmanisha@gmail.com.